**මාධ්‍ය නිවේදනය**

**2018 ඔක්තෝබර් 04, කොළඹදී...**

Nestlé
Good Food, Good Life

# ජනාධිපති අපනයන සම්මාන උළෙලේදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදන වෙනුවෙන් 'වැඩිම විදේශ විනිමය ඉපැයුමක් සිදුකළ අපනයනකරු' සම්මානය නෙස්ලේ දිනාගනී

*ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම ඉහළ නංවන අතරේදී දේශීය ජනතාවගේ ජීවනෝපාය නඟාසිටුවීමට ද අඛණ්ඩ දායකත්වය*

පසුගියදා පැවැති ජනාධිපති අපනයන සම්මාන උළෙලේදී පොල් මදය ආශ්‍රිත නිෂ්පාදන අංශය වෙනුවෙන් 'වැඩිම විදේශ විනිමය ඉපැයුමක් සිදුකළ අපනයනකරු' සම්මානය දිනාගැනීමට නෙස්ලේ සමාගම සමත්විය. මෙරට අපනයන සඳහා දැක්වූ ශක්තිමත් දායකත්වයත්, දේශීය පොල් වගාකරුවන්ට හා ගොවිපොළ සේවකයන්ට තිරසාර ජීවිකාවක් උදාකරලීමට ගත් ප්‍රයත්නයත් විශේෂ පිළිගැනීමට ලක්කරමින් මෙසේ ජනාධිපති අපනයන සම්මානයට නෙස්ලේ සමාගම පාත්‍ර වූ හත්වැනි අවස්ථාව මෙය විය.

නෙස්ලේ ලංකා සමාගම, ලොව විශාලතම පිටිකළ පොල් කිරි අපනයනකරුවෙකු ලෙස ප්‍රකට ය. එම නිෂ්පාදන ලොව පුරා රටවල් 50කට වැඩි සංඛ්‍යාවකට අපනයනය කෙරෙන අතර දේශීය වෙළෙඳපොළ තුළ මැගී සන්නාමය යටතේ බෙදා හැරේ. කුරුණෑගල පිහිටි නෙස්ලේ සමාගමේ කර්මාන්තශාලාවේ නිෂ්පාදනය කරනු ලබන මෙම නිෂ්පාදනය වෙනුවෙන් වාර්ෂිකව මෙරටින් පොල් මිලියන 90ක පමණ ප්‍රමාණයක් ලබාගැනේ. ඒ හරහා 6,000කට ආසන්න පොල් ගොවි පවුල්වලට තිරසාර ජීවිකාවක් ද සලසා දී තිබේ.

මේ ජයග්‍රහණය පිළිබඳ අදහස් දක්වමින් නෙස්ලේ සමාගමේ සැපයුම් දාම අංශයේ උප සභාපති ජොසේ රොල්ඩාන් මහතා මෙසේ පැවසීය. "ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට හිමිවන ඉහළම ඇගැයුම වන්නේ ජනාධිපති අපනයන සම්මානයි. පොල් වැනි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ වැවිලි භෝගයක් ලෝකයේම ජනප්‍රිය නිෂ්පාදනයක් ලෙස ඉහළට ඔසවා තැබීමට හැකිවීම අපට ආඩම්බරයක්. එම සාර්ථකත්වය වෙනුවෙන් මෙවැනි සම්මානයක් හිමිවීම පිළිබඳව අපි මහත් සේ සතුටට පත්වෙනවා. ඒ වගේම අපගේ වෑයම තුළින් ඉහළම රසයක් හා උසස්ම ප්‍රමිතියක් සහිත ලොව වැඩිම ඉල්ලුමක් ඇති නිෂ්පාදනයක් බවට ශ්‍රී ලංකාවේ පිටි කළ පොල්කිරි පත්ව තිබෙනවා".

අසූව දශකයේදී මෙරට තුළ පිටි කළ පොල්කිරි නිෂ්පාදනය සඳහා නෙස්ලේ මුලපිරූ අතර අඛණ්ඩව එම කර්මාන්තයේ දියුණුව වෙනුවෙන් ආයෝජනය කරනු ලැබීය. 2016දී පොල් වගා මණ්ඩලය හා එක්ව 'නෙස්ලේ පොල් වගා සැලසුම' නම් වැඩසටහනක් ද හඳුන්වාදුන්නේ ඒ අනුව ය. පොල් ත්‍රිකෝණය තුළ මෙන්ම ඉන් බාහිරව පොල් වගාවෙන් සාර්ථක ප්‍රතිඵල අත්කර ගත හැකි බවට හඳුනාගන්නා ලද ප්‍රදේශවලත් (උතුරු මැද සහ උතුරු පළාත්වල) වාණිජ මට්ටමේ මෙන්ම ගෘහස්ථ මට්ටමේ පොල් වගාකරුවන් පොල් වගාව සඳහා දිරිමත් කිරීම මෙම වැඩසටහනින් සැලසුම් කෙරේ. ඒ යටතේ මේ දක්වා පොල් වගාවේ නියුතු පවුල් 3,000කට ඉහළ සහ ඉක්මන් අස්වැන්නක් සහිත පොල් පැළ 20,000ක්

බෙදා දුන් අතර අඛණ්ඩ පුහුණු වැඩසටහන් මාලාවක් ද සම්පත් හා කෘෂි සහාය ද පොල් වගාවේ ප්‍රශස්ත භාවිතාවන් උගත හැකි අයුරින් ආදර්ශ ගොවිපොළක් ද පිහිටුවන ලදී.

නෙස්ලේ සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂිකා ෂිවානි හෙග්ඩේ මහත්මිය මෙසේ අදහස් දැක්වූවාය. "නැවත වරක් අපනයන ක්ෂේත්‍රයේ අපගේ දායකත්වය සහ අපගේ සැපයුම් දාමය හරහා දේශීය ජන ජීවිතය උසස් කරලීම වෙනුවෙන් දුන් දායකත්වය වෙනුවෙන් ඇගයීමක් හිමිවීම අපට මහත් අභිමානයක්. අපගේ සහාය තුළින් දේශීය සැපයුම්කරුවන්ට තමන්ගේ ගුණාත්මකභාවයේ ප්‍රමිතීන් වැඩිදියුණු කරගැනීමටත්, ගොවි ජනතාවට ආර්ථික ලාභ සහිත වගාවන්ට යොමුවීමටත් ශක්තියක් ලැබෙනවා. දේශීය ගොවි පවුල්වලට සහාය දීමෙන් ශක්තිමත් ප්‍රජාවක් නිර්මාණය කිරීමත්, ග්‍රාමීය ජනතාවටත් ඔවුන්ගේ පවුල්වලටත් ප්‍රතිලාභ සැලසෙන අයුරින් තිරසාර ආදායම් මාර්ග හිමිකරදීමත්, ඒ තුළින් පොල් කර්මාන්තයේ දිගුකාලීන සුරක්ෂිතභාවය සහතික කරගැනීමත් අපගේ අරමුණයි. අප සිදුකරන සියලු ආයෝජන, හුදෙක් සමාගමේ පමණක් නොව මුළු රටේම ප්‍රගතියට හේතුවන ආයෝජනයක් වීම ඉතා වැදගත්. අපගේ සෑම පියවරකදීම එම ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට ලැබීමත් අපට ආඩම්බරයක්".

ජනාධිපති අපනයන සම්මාන උළෙල යනු මෙරට අපනයන ක්ෂේත්‍රයට සුවිශේෂී දායකත්වයක් දැක්වූ සමාගම් අගය කිරීමටත් සම්මාන පිරිනැමීමටත් වෙන්වූ වාර්ෂික උත්සවයකි. එය සංවිධානය කරනු ලබන්නේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසිනි. මීට පෙර 2010 හා 2013 වසරවලදී පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන අංශයේ හොඳම අපනයනකරු සම්මාන ද 2011 දී ආහාර සහ වෙනත් පාන වර්ග නිෂ්පාදන අංශයේ හොඳම අපනයනකරු සම්මානය ද 2014 හා 2015 වර්ෂවලදී අපනයන සඳහා දායකත්වය දුන් හොඳම බහුජාතික සමාගම යන සම්මාන ද 2017 දී පොල් මද ආශ්‍රිත නිෂ්පාදන කාණ්ඩයේ වැඩිම අගය එකතුකළ අපනයනකරු සම්මානය ද නෙස්ලේ සමාගමට හිමිවිය.

---